# දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක් වූ පොලොන්නරුව තාක්ෂණ කෞතුකාගාරයට අලෙවිකරණ සැලැස්මක්

පී.ඒ.කේ. ගීත් කුමාරතුංග[1]

පුද්ගලයින් සිය රුචිකත්වය සහ කුතුහලය පදනම්ව ඒකරාශී කරන ලද භාණ්ඩ එකතුන් පසු කාලයේදී කෞතුකාගාර නමින් සංකල්පයක් ඔස්සේ වර්ධනය විය. වර්තමානය වනවිට කෞතුකාගාර සංකල්පය ලොව පුරා ව්‍යාප්ත වී ඇත. කෞතුකාගාර සංකල්පය තුළ කෞතුකාගාරයක් සාර්ථක අයුරින් නඩත්තු කර පවත්වාගෙන යමින් සිය අරමුණු සාක්ෂාත් කරගැනීම යම්කිසි මූල්‍ය ස්ථාවරත්වයක් පැවතීම මෙන්ම එලදායී නරඹන්නන් පිරිසක් ඒ වටා ඒකරාශී වී සිටීම ඉතාමත් වැදගත්ය. විවිධ තේමාවන් ඔස්සේ නිර්මිත කෞතුකාගාර අතර මෑතකදී ශ්‍රී ලංකාවේ ඉදිවූ සුවිශේෂී කෞතුකාගාරයක් වශයෙන් පොලොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය කෙරෙහි නරඹන්නන් ආකර්ෂණය කරගැනීම සඳහා සාර්ථක අලෙවිකරණ සැලැස්මක් නිර්මාණය කිරීම සහ එසේ නිර්මාණය කරන ලද අලෙවිකරණ සැලැස්ම සමඟ සසඳමින් දැනට පොලොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයේ පවතින විභවතා හඳුනාගැනීම සහ පවතින දුර්වලතා සඳහා අවශ්‍ය වන යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. දත්ත රැස්කිරීම් වශයෙන් සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ මෙන්ම පොලොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය වෙත කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් ලබාගන්නා ලද තොරතුරු මත පදනම් වෙමින් මෙන්ම ඒ ආශ්‍රිත න්‍යායාත්මක කරුණු සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ ලබාගනිමින් එහි අවසන් නිගමනය ඉදිරිපත් කිරීම සිදුකරන ලද අතර සාර්ථක අලෙවිකරණ සැලැස්මක් නිර්මාණය කරගැනීම සඳහා නම් අනිවාර්යයෙන්ම කෞතුකාගාරයක පවතින අරමුණු සහ අභිප්‍රායන් සම්බන්ධයෙන් මනා අවබෝධයක් පැවතීමත් ඒවා මුදුන් පමුණුවාගැනීමට හැකිවන ආකාරයෙන් අලෙවිකරණ සැලැස්ම සකස්කළ යුතු බවත් මෙම පර්යේෂණයෙන් හඳුනාගන්නා ලදී. දේශීය සංචාරකයින් තරමක් දුරට මෙම කෞතුකාගාරය කෙරෙහි ආකර්ෂණය වුවත් විදේශීය සංචාරකයින් ආකර්ෂණය වීමක් නොමැති ආකාරයක් මෙම පර්යේෂණය මඟින් හඳුනාගැනීමට හැකියාව ලැබිණ. එහිදී සංචාරකයින් ආකර්ෂණය කරගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනා අතුරින් විධිමත් වෙබ් අඩවියක් නොමැති බැවින් කෞතුකාගාරයට සංචාරකයන් ආකර්ෂණය කරගැනීමට හැකිවන පරිදි නිර්මාණ ශීලී වෙබ් අඩවියක් සකස් කිරීම, පොලොන්නරුව දුම්රිය ස්ථානයේ සහ ප්‍රධාන බස් නැවතුම්පළ ආශ්‍රිතව ඩිජිටල් පුවරු මඟින් කෞතුකාගාරය පිළිබඳ දැනුවත් කිරීම, පැරණි නටඹුන් නගරයේ සිට කෞතුකාගාරයට නියමිත කාලසටහනකට ප්‍රවාහන පහසුකම් සැලසීම වැනි සාර්ථක අලෙවිකරණ උපායමාර්ග කිහිපයක් යෝජනාවලියක් වශයෙන් ඉදිරිපත් කිරීම ද මෙම පර්යේෂණය මඟින් සිදුකරන ලදී.

ප්‍රමුඛ පද : අලෙවිකරණය, කෞතුකාගාර, නරඹන්නන්, පුරාණ තාක්ෂණය, ප්‍රවර්ධනය

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.geeth95kalana@gmail.com